දිඹුලාගල ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ අංක 6.20 ප්‍රකාරව වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ අවසාන දිනට එක් එක් වත්කම් වලට අදාලව පිරිවැය, සමුච්චිත ක්ෂය, වාර්ෂික ක්ෂය සහ ශුද්ධ අගය දක්වමින් උපලේඛන සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත්, වත්කම්වල පිරිවැය පමණක් දක්වා උපලේඛන සකස් කර ඉදිරිපත් කර තිබුණි.	උපලේඛන ඉදිරිපත් කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 2.7 අනුව ප්‍රාග්ධන වියදම් ප්‍රදාන එකවර ආදායමට හඳුනා නොගෙන ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට සටහන් කළ යුතු වුවත් එලෙස කටයුතු නොකර එක් එක් වර්ෂයේ ලද හා ලැබිය යුතු ප්‍රාග්ධන මුළු මුදලම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එකවර ආදායමට හඳුනාගෙන තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීම් සිදුකරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.7 යටතේ පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගන්නා බව දක්වා තිබුණද ඊට පටහැනිව ප්‍රාදේශීය සභාව විසින් ස්ථාවර තැන්පතු පොලී වටිනාකම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.	ශේෂ සනාථ කිරීම මත පොලී වටිනාකම ගලපන ලද බව.	උපචිත පදනම මත පොලී ආදායම් ගිණුම්ගත කළ යුතුයි.

1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාවට අයත් අරලගංවිල සති පොල භූමිය ගල් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම රු.6,858,974 ක් වුවත් 2021 වර්ෂයේ එය රු. 6,899,585 ක් ලෙස රු.40,611 ක් වැඩියෙන් දක්වා ක්ෂය කර තිබූ අතර, ඉහත වටිනාකම තුළ අතරුඳවුම් මුදල රු.344,979 ක් ඇතුළත්ව තිබියදී සමාලෝචිත වර්ෂයේ මංමාවත්, පාලම් සහ බෝක්කු යටතේ එම මුදල නැවත ගිණුම්ගත කිරීම හේතුවෙන් දේපළ පිරියත වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘති (LDSP) ප්‍රතිපාදන යටතේ ඉදිකළ මනම්පිටිය පෙරපාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ වටිනාකම ගොඩනැගිලි යටතේ රු.15,823,230 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.395,581 ක් අඩුවෙන් ද, එහි ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම රු.163,275 ක් අඩුවෙන් ද, නුවරගල හා සිරිපුර ජල ව්‍යාපෘතිවල වැලි පිරිපහදු ගබඩා ඉදිකිරීමේ ව්‍යාපෘති වටිනාකම් රු.646,729 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	සිරිපුර හා නුවරගල ජල ව්‍යාපෘති වල වැලි පිරිපහදු ගබඩා ඉදිකිරිම් ව්‍යාපෘති දෙකක හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමේ ව්‍යාපෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ ලද රු.810,004 ක අතරුඳවුම් වටිනාකම කොන්ත්‍රාත් හා අතරුඳවුම් තැන්පත් යටතේ හෝ කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මනම්පිටිය නගරයේ ග්‍රාමීය වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම රු.4,989,965 ක් කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගත් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලද වත්කම් අයිතම 08 ක වටිනාකම රු.1,553,369 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	2020, 2023 හා 2024 වර්ෂවල ඉටුකරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති 27 ක වටිනාකම නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන්, එහි පිරිවැය වටිනාකම රු.35,524,549 ක් අඩුවෙන් දක්වා ඒ මත පදනම්ව ක්ෂය ගණනය කිරීම හේතුවෙන් ක්ෂය වටිනාකමද අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(උ)	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද ජල ව්‍යාපෘති මාර්ග 02 ක සහ ජල නල දීර්ඝ කිරීමේ ව්‍යාපෘති වටිනාකම රු.9,146,457 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂය තුල මහියංගනය උසාවියෙන් ලද උසාවි දඩ වටිනාකම රු.2,059,499 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් උසාවි දඩ හිඟ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අනියම් සේවක වැටුප් වටිනාකම රු. 132,264 ක් විවිධ ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබියදී නැවත සාවද්‍ය ලෙස රු. 146,787 ක් ගෙවිය යුතු වැටුප් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වගකීම් හා වියදම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ද්විගණන දෝෂයක් සිදුවී ඇති බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඒ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව බැංකු ගිණුම් දෙකකට අදාල ශේෂය එකතුව රු. 72,903,853 ක් වුවත් මූල්‍ය ප්‍රකාශ වල එම ශේෂය එකතුව රු. 72,656,600 ක් වූයෙන් වෙනස රු.247,253 ක් විය.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

1.6.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ 6 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාල උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී. රු.17,995,535 ක නොසැසඳීමක් පැවතුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රීති හා ප්‍රඥප්ති විධිවිධාන ධූර කාලය අවසන්ව ඇති පළාත් පාලන ආයතන වල කටයුතු පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය මගින් 2023 මැයි			

	මස නිකුත් කර ඇති පළාත් පාලන ආයතන මාර්ගෝපදේශය			
(i)	අංක 01 (i) 5.2.3 ඡේදය	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් පරිදි ඒකකයක් සභාව තුළ පිහිටුවා තිබීම අනිවාර්ය වුවත් ප්‍රාදේශීය සභාව සතු දඹගහ උල්පත කසල අංගනය 2024 ජනවාරි මස සිට කසල කළමනාකරණය සඳහා භාවිතා කර නොතිබුණි.	කසළ අංගනය ආරම්භ කිරිමට සැලසුම් කර ඇති බව.	මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.
(ii)	5.2.3.1 (V) ඡේදය	දිරන කසල භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වුවත් ප්‍රාදේශීය සභාව මගින් රැස් කරනු ලබන දිරන කසල භාවිත කර කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු නොකර 2024 වර්ෂයේදි රැස් කරන ලද ටොන් 230 ක පමණ දිරන කසල ප්‍රමාණයක් ලංකාපුර ප්‍රදේශීය සභාවේ කසල අංගනය වෙත බැහැර කර තිබුණි.	කසළ අංගනය ආරම්භ කිරිමට සැලසුම් කර ඇති බව.	මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2020 ජූලි 03 දිනැති අංක 2182/39 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති			
(i)	රීති අංක 299	ප්‍රවර්තන වර්ෂයෙහි මාර්තු 31 දිනට නොගෙවන ලද කර්මාන්ත බද්දට හෝ ව්‍යාපාර බද්දට යටත් දේපල හා පැහැර හරින්නන් පිළිබඳ ලැයිස්තු සකස් කර ප්‍රවර්තන වර්ෂයෙහි අප්‍රේල් 30 දිනට පූර්වයෙන් ප්‍රාදේශීය සභාවේ ආදායම් අංශයෙහි ප්‍රධානියා විසින් ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත වාර්තා කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ලැයිස්තුවක් සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	රීති අංක 300 හා 417	ප්‍රවර්තන වර්ෂයෙහි මාර්තු 31 දින වන විට නොගෙවන ලද කර්මාන්ත බද්ද හා ව්‍යාපාර බද්ද අයකර ගැනීමෙහිලා මූලික නීතියෙහි විධිවිධාන අනුගමනය කිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මූල්‍ය රීති සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබද රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මු.රෙ. 369 (ආ)	බැංකු ගිණුම් 02 කට අදාලව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ කාලය මාස 06 ඉක්මවූ රු. 548,951 ක චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මු. රෙ. 571	ටෙන්ඩර් හා කර්මාන්ත තැන්පතු යටතේ කාලය වර්ෂ 02 ක් ඉක්මවා ඇති රු.3,094,076 ක ඉකුත් තැන්පතු 53 ක් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
	රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 මැයි 12 දිනැති අංක 02/2021(VIII) දරන චක්‍රලේඛය	2023 මැයි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (I) දරන චක්‍රලේඛයෙහි 2 (I) උප වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් විසින් ඉහත විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සළකුණු යන්ත්‍රය ක්‍රමවත්ව භාවිතා කර නොතිබුණි.	චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව හා ඒ සම්බන්ධයෙන් සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලද බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 46,540,755 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු. 6,158,936 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු	රු.	රු.	රු.	රු	රු.	රු.	රු.
වරිපනම් හා බදු	2,171,480	3,338,000	3,397,860	633,360	2,171,480	3,046,655	2,320,180	693,220
කුලී	5,646,564	4,631,745	5,160,862	3,288,268	5,646,565	4,533,785	3,012,217	3,817,385
බලපත්‍ර ගාස්තු	1,167,250	1,629,280	1,478,280	1,944,155	1,167,250	585,210	271,000	1,796,155
වෙනත් ආදායම්	70,108,116	75,754,033	74,478,104	25,503,496	96,690,296	64,451,893	48,508,903	24,277,568
එකතුව	79,093,410	85,353,058	84,515,106	31,369,279	105,675,591	72,617,543	54,112,300	30,584,328

2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු ආදායම රු.72,000 ක් හා හිඟ ව්‍යාපාර බදු ආදායම රු.561,360 ක් විය.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.673,203 ක් විය.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට හිඟ සතිපොළ බදු ආදායම වූ රු.2,318,915 කින් රු.2,269,315 ක මුදලක් වසර 02 සිට වසර 14 දක්වා කාලයක සිට හිඟව පැවතුණි.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(iii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වාහන හා යන්ත්‍ර කුලී ආදායම රු.296,150 ක් වූ අතර එයින් රු. 165,750 ක හිඟ ශේෂ 05 ක් වසර 04 සිට වසර 06 දක්වා කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති අතර නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,796,155 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායමක් පැවති අතර, එයින් රු.1,634,655 ක ශේෂයක් ලැබිය යුතු පෙර හිඟ ලෙස දක්වා, නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	**වෙනත් ආදායම්**		
(i)	ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘති 04 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු. 20,717,982 ක් සහ වර්ෂයේ බිල් කිරීම් රු.59,075,156 ක් සමඟ රැස්කළ යුතු මුළු ආදායම රු.79,793,138 ක් වුවත්, රැස් කළ ආදායම රු.54,493,643 ක් වුයෙන් ජල ගාස්තු රැස්කිරීමේ කාර්යසාධනය සියයට 68 ක අගයක් පමණක් විය.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ පරිසර බලපත්‍ර ගාස්තු ආදායම රු. 216,000 ක් විය.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	ඉදිරිපත් කළ තොරතුරු අනුව, උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.81,551,915ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.3,587,300 ක් විය.	ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇති බව.	ප්‍රමාදයකින් තොරව උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භ කරන ලද මනම්පිටිය පෙර පාසලේ දෙසැම්බර් 31 දිනට හිඟ පෙරපාසල් මාසික ගාස්තු	ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	හිඟ මුදල අය කර ගැනීමටත්, මාසික ගාස්තු එම මාසයේම

	රු.204,000 ක් වූ අතර එයින් රු. 68,000 ක් 2024 වර්ෂයේ පෙර පාසලින් ඉවත් වූ සිසුන් 08 දෙනෙකුට අදාලව හිඟව පැවතුණි.		අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාවේ 2019, 2020 සහ 2021 වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 05 කට අදාලව ලබාදී තිබූ අත්තිකාරම් මුදල් රු.926,582 කට අදාල ව්‍යාපෘති කිසිවක් ඉටුකර නොතිබියදී එම අත්තිකාරම් මුදල් සභාව වෙත අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අත්තිකාරම් පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව.	අත්තිකාරම් මුදල් පියවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	දිඹුලාගල ජල ව්‍යාපෘතියේ ජල පෙරණ ටැංකි සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,850,000 ක සැකසූ වැලි යොදා මසකට වරක් ජල පෙරණ පිරිසිදු කිරීමට අපේක්ෂා කළ ද දින 04 කට වරක් ජල ටැංකි හිස්කර මඩ සහිත වැලි ඉවත්කිරීමට සිදුව තිබුණි. ජල පෙරණ සඳහා කරන ලද වියදම අනාර්ථිකව තිබූ අතර අධික මඩ සහිත ජලයේ මඩ තැන්පත් වීම සඳහා රළු වැලි පෙරණ ටැංකියක් ඉදිකිරීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුවී නොතිබුණි.	ජල ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ජලය වැවෙහි එම කාල වකවානුව තුළ පැවති සාන්ද්‍රනික අපද්‍රව්‍ය ඉහළ යාම නිසා එලෙස අවම දින ගානකදී ජල පෙරණ අවහිරවීම සිදුවන බව.	රළු වැලි පෙරණ ටැංකියක් ඉදිකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු විය යුතුය.
(ඈ)	මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර ඇති ඇස්තමේන්තු වටිනාකම රු.196,582,600 ක් වූ සභාව විසින් භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම් කැබලි 196 ක් පමණ පවතින අතර, ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර වර්ෂ 37 කට අධික කාලයක් ගතවී තිබුණද, අදාළ ඉඩම් සභාව වෙත විධිමත් පරිදි පවරාගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලිඛිතව අවස්ථා කීපයකදී ඉල්ලා ඇතත්, ඒ සඳහා නිසි පිළිතුරක් මේ වනතෙක් ලැබී නොමැති බව.	ඉඩම් සභාව වෙත විධිමත් පරිදි පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව පොළොන්නරුව උසාවියෙන් ලැබිය යුතු උසාවි දඩ බිල්කිරීමේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	වටිනාකම හඳුනාගත නොහැකි බව.	වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	ස්ථාවර තැන්පතු ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත නොකර, 2025 මාර්තු 06 දිනට රු.15,809,620 ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශන වල වල දක්වා තිබුණි.	ශේෂ සනාථන සහතිකය මත ගැලපීම් සිදුකළ බව.	නිවැරදි වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(උ)	කර්මාන්ත ණයගැති යටතේ 2021 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.22,564,721 ක් වටිනා ණයගැති ශේෂ 11	මුදල් ප්‍රතිපාදන ලැබෙන තෙක් නිරවුල් කිරීමට හැකියාවක් නොමැති බව.	කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

	ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ඖ)	කර්මාන්ත ණයහිමි යටතේ 2018 වර්ෂයේ සිට 2021 දක්වා කාලයට අදාලව ඉදිරියට ගෙන එමින් පවතින රු.21,694,215 ක් වටිනා ණයහිමි ශේෂ 22 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති නිමකිරීමට අදාළව දෝෂ පැවතීම හා ව්‍යාපෘති ප්‍රතිපාදන නොලැබීම මත නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව.	නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	2011 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක විසින් සිදුකරන ලද මූල්‍යමය අලාභය රු.1,367,681 ක් ලෙස හඳුනාගෙන 2021 දෙසැම්බර් 27 දින විනය නියෝග පනවා තිබූ නමුත් ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අදාළ වටිනාකම සභාව වෙත පියවන ලෙස අදාළ පාර්ශවයන් වෙත ලිඛිතව දැනුවත් කරන ලද අතර, ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව.	අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඒ)	2014 දෙසැම්බර් 16 දින සභාවට ලබාදී තිබූ ගැල්වනයිස් කොඩිකණු 360 ක් හිටපු සභාපතිවරයා හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු වෙත නිකුත් කර වසර 06 කට අධික කාලයක් ගතව ඇතත් ඒවා සභාව වෙත ලබාගෙන නොතිබුණි.	අදාළ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලද බව.	අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
වාහන 13 ක් සඳහා සවි කළ GPS පද්ධති හා වාහන සේදුම් ස්ථානය පවත්වාගෙන යාම සඳහා මිලටගත් උපකරණ ඇතුළු සවිකිරීම් වටිනාකම රු. 1,655,000 ක් වර්ෂ 2 සිට වර්ෂ 4 දක්වා කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.	උපයෝජනය කිරිමට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදනය

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සභාවේ ජල ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් වැලි පෙරන සඳහා වැලි මිලදීගැනීම වෙනුවෙන් මිලගණන් කැඳවා තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 35 අතිරේකය (Supplement-35) අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සීමාව රු.මිලියන 05 ක් බැවින් මෙම ප්‍රසම්පාදනයේ වටිනාකම රු.මිලියන 30 ක් වීම හේතුවෙන් 2024 මාර්තු 27 දින රැස්වූ සභාවේ ප්‍රසම්පාදන කමිටුවට මෙම මිලදීගැනීම ඉහල කමිටුවකට යොමු නොකර ප්‍රසම්පාදන උපදෙස් වලට පටහැනිව ප්‍රසම්පාදන කොටස්වලට වෙන් කර සීමා ඉක්මවා නොයන පරිදි නැවත මිල කැඳවීම් සිදු කර තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 3.4 පරිච්ඡේදයට අනුව වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සිදුකරන්නේ කෙසේද යන්න සඳහන් කර ඇති අතර දුරකථන නාමාවලියේ දේදුනු පැහැති පිටු (Rainbow Pages)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 3.4 පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

		උපයෝගී කරගෙන සැපයුම්කරුවන් 06 දෙනෙකු හා ආයතනයේ ඉල්ලීම මත වෙනත් ආයතනයකින් මිල කැඳවා ඇති බව.	
(ආ)	පළමුවර මිල කැඳවූ සැපයුම්කරුවන් 06 දෙනාගෙන් දෙවන වර ද මිලකැඳවා තිබූ අතර ආයතන 2 කින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. නමුත් ඉන් එක් ආයතනයක් මිල කැඳවීම් සිදු කර නොතිබුණු ආයතනයක් වූ අතර එම ආයතනයේ මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමකින් තොරව මිල ඇගයීම් කර ප්‍රසම්පාදනය පිරි නමා තිබුණි.	මිල ගණන් කැඳවා නොමැති ආයතනයේ ඉල්ලීම මත එම ආයතනයෙන් මිල ගණන් භාරගත් බව හා ජල ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	දෙවනවර මිලගණන් ඉදිරිපත් කිරීමට අදාළව මිලගණන් විවෘත කිරීම 2024 අප්‍රේල් 09 දින සිදුකර ඇති අතර, මිල කැඳවීම් නොකළ ආයතනය ඔවුන්ගේ ලංසු ලියවිලි ඉදිරිපත් කළ දිනය ලෙස 2024 අප්‍රේල් 10 යොදා තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවයක් නොතිබුණි.	ලංසු ලේඛණ 2024/04/09 දින විවෘත කල බවත් ප්‍රශ්නගත ආයතනයේ ලංසුවේ දිනය 2024/04/10 ලෙස සටහන්ව තිබීම පිළිගන්නා බව.	මිල ගණන් කැඳවීම නියමිත දිනට විනිවිදභාවයකින් යුතුව කළ යුතු බව.
(ඈ)	තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගන්නා ලද සාර්ථක සැපයුම්කාර ආයතනයේ වැලි සාම්පල පිළිබඳ පරීක්ෂණ වාර්තාව අනුව එක් නිර්ණායකයක් අපේක්ෂිත ගුණත්වයෙන් නොමැති බවට වාර්තාව ලබාදී තිබියදී ප්‍රසම්පාදන තීරණ ලබාදී මාසයක් ගතවීමෙන් අනතුරුව අවස්ථා දෙකකදී ලබාදී ඇති පරීක්ෂණ වාර්තා පදනම් කරගෙන වැඩි මිලගණන් ඉදිරිපත් කර ඇති සැපයුම්කරු තෝරාගෙන තිබිණි. නුසුදුසු තත්ත්වයෙන් පැවති වැලි නැවත අවස්ථාවලදී ලබාගන්නා වාර්තා මගින් සුදුසු තත්ත්වයේ බවට වාර්තා ලැබීම තුළ එම වැලි සුදුසු තත්ත්වයට පත්කිරීමට සභාව විසින් සැපයුම්කරුට අවස්ථා ලබාදී තිබුණද අවම මිල ඉදිරිපත් කර ඇති සැපයුම්කරුවෙකු ඉදිරිපත්ව සිටීම හා තෝරාගත් සැපයුම්කරු ලංසු ලියවිලි ලබා නොදුන් අයෙකුවීම මත මුල් අවස්ථාවේම ප්‍රතික්ෂේප විය යුතුවා සේම, මිලගණන් විවෘත කිරීමට පසු දිනයකදී ලංසු ලියවිලි භාරදී තිබීම, මිල විවෘත කිරීමේ දිනයේදී වැලි සාම්පල් පරීක්ෂාවට භාජනය නොකිරීම යන හේතු මත අවම ලංසුකරුට ඔහුගේ වැලිවල ගුණත්වය අපේක්ෂිත මට්ටමට සකස්කිරීමට අවස්ථාව ලබාදී අවම මිලක් යටතේ ඔහුගෙන් වැලි ලබානොගැනීම තුළ සභාවට සිදුව තිබූ පාඩුව රු.927,500 ක් විය.	අවම මිල ඉදිරිපත් කළ ආයතනයේ වැලි ගුණාත්මක තත්වයෙන් නොතිබූ බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	තෝරාගත් ආයතනය විසින් 2024 මැයි 14 දින ඉදිරිපත් කරන ලද ලිපිය අනුව පිරිපහදු වැලි සැපයීමට නොහැකි බවත් පරිශ්‍රය තුළ සකසා දීමට සිදුවන බවත්, ඒ සඳහා සභාවේ ජල ව්‍යාපෘති පරිශ්‍රය, විදුලිය සහ බැකෝ	කොන්ත්‍රාත්කරුගෙන් විදුලිය සඳහා අයවීමට ඇති මුදල සභාව වෙත ගෙවන ලෙස වාචිකව මෙන්ම	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට හා අදාළ මුදල් අයකර

ලෝඩරය අවශ්‍ය බව දන්වා තිබුණි. ඒ සඳහා අයකිරීමක් කළ බවට සාක්ෂි නොමැති අතර ගිවිසුමේ මූලික කොන්දේසිය කඩකිරීම හේතුවෙන් ගිවිසුම අවසන් නොකර සභාව විසින් මහජන මුදල් භාවිතා කරමින් තෙවන පාර්ශවයක් වෙත පහසුකම් සලසා තිබුණි.	ලිඛිතවද ඔහු වෙත දන්වා සිටින ලද බැවින් එම මුදල ගෙවීමට එකගතාවය ඔහු විසින් මා වෙත පළකර ඇති බව.	ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර, ද්විතියික මට්ටමට අයත් තනතුරු 08 ක් සහ ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 04 ක් වශයෙන් තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතුණි.	අදාළ ආයතන දැනුවත් කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට අයත් නොවූ අනියම් හා ස්ථිර වශයෙන් තාක්ෂණික සහායක නිලධාරීන් දෙදෙනෙකු, රියදුරන් දෙදෙනෙකු, කාර්යාල කාර්යය සහායකයින් හතර දෙනෙකු, වැඩ/ ක්ෂේත්‍ර කම්කරුවෙකු, සෞඛ්‍යය කම්කරුවන් හතර දෙනෙකු, කම්කරුවන් පස් දෙනෙකු, සුසාන භූමි සහායකයින් තිදෙනෙකු, ජල කාර්මිකයෙකු, වාහන පිරිසිදු කරන්නන් තිදෙනෙකු හා බර වාහන/ යන්ත්‍ර ක්‍රියාකරුවකු වශයෙන් 26 දෙනෙකු අතිරික්තව පැවතුණි.	අදාළ ආයතන දැනුවත් කර ඇති බව.	අවශ්‍ය පරිදි කාර්යය මණ්ඩල සංශෝධනය කර ගැනීමට හෝ අතිරික්ත කාර්යය මණ්ඩලය ස්ථානමාරු කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයෙකු 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වැඩ පරීක්ෂක තනතුරට පත් කර රු.2,162,021 ක මුදලක් සහා අරමුදලින් ගෙවීම් කර තිබුණු අතර, මූලික සුදුසුකම් නොමැති වීම මත 2024 වර්ෂයේ ස්ථිර පත්වීම් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් සභාව තුළ තවදුරටත් එම තනතුරෙහි පුරප්පාඩුවක් පැවතුණි.	බඳවාගැනීමට අදාළව දැන්වීමක් ප්‍රදර්ශනය කර ලද අයදුම්පත් මඟින් තෝරා ගත් බව.	මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති පුද්ගලයෙකු අදාල තනතුරට පත් කළ යුතු අතර පත්වීම් බලධාරියාට එරෙහිව විනය කටයුතු කළ යුතුය.
(ඈ)	වසර 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු.150,855 ක් වූ සේවක ණයශේෂ 05 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2015 මාර්තු 18 දිනැති උතුරුමැද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 4/2015 හි 1.3 ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කර සෑම මසකම අවසානයේදීම මහා සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.	අභ්‍යන්තර විගණනය ස්වාධීන නිලධාරියකුට ලබා දීමට තරම් ප්‍රමාණවත් සේවකයින් සභාව සතුව නොමැති බව.	චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2024 අයවැය මගින් වියදම් ශීර්ෂ 4/1312 යටතේ ඉදි කිරීමට සැලසුම් කර තිබූ රු.16,440,000 ක් වටිනා ව්‍යාපෘති 14 ක් අතරින් රු. 8,940,000 ක් වටිනා ව්‍යාපෘති 07 ක් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කර නොතිබුණි.	ඉටුකර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘති 2025 වර්ෂයේ අයවැය සඳහා ඇතුළත් කර ඇති බව.	අයවැය ලේඛනයේ ඇතුළත් ව්‍යාපෘති වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ යුතුය.

4.3 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේදී දිරන කසල ටොන් 230 ක් සහ නොදිරන කසල ටොන් 26 ක් රු. 8,319,115 ක වියදමක් දරා රැස්කර තිබුණු අතර, නොදිරන කසල අලෙවි කිරීම මගින් රු.34,226 ක ආදායමක් රැස්කර එයින් සෞඛ්‍ය සේවකයන් සඳහා රු. 17,113 ක් ගෙවීම් කළ පසු සභාවේ ආදායම ලෙස රු.17,113 ක ඉතා පහළ අගයක් ඉතිරිව පැවතුණු අතර, වාර්ෂිකව කසල රැස් කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් එම පිරිවැය අවම කර ගැනීම සඳහා සභාව සතු කසල අංගනය ක්‍රියාත්මක තත්වයට පත්කර කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීමේ වැඩ පිළිවෙලක් කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි.	කසල අංගනය 2025 වර්ෂය තුළ ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, ඉදිකිරීම් අවසන් කිරීමෙන් අනතුරුව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කරන බව.	කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.